# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,087 — 1960 මාර්තු 18 වැනි සිකුරාද — 18.3.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (II) වැනි ඡේදය–පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක්, භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)



| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... | 221 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 224 | ආණ්ඩුවේ තොවන දන්වීම් ... ... | — |
| වැන්ඩර් කැඳවීමේ දන්වීම් ... ... | 225 | රට සීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| තීරණය කළ වැන්ඩර් පත් පිළිබඳ දන්වීම් ... | — | වෙන්දේසි කිරීම පිළිබඳ දන්වීම් ... ... | — |
| බඩු බාගිරාදිය විකිණීම ... ... | 231 | විවිධ දන්වීම් ... ... ... | — |



## තනතුරු-ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

දීමනා.—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හි දී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. සේවා කොන්දේසි.—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්‍ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය ඔනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට, ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්‍ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්‍ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. නවප්‍රවේශක නිලධාරීහු.—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරු වලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන්, කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන් හිදී මිස, අන් හැම අවස්ථාවකදීම ආධුනික/පරීක්‍ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූල ව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් ස්වකීය ආධුනික/පරීක්‍ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්‍ෂණයකින් සමත්වීම, ආධුනික/පරීක්‍ෂා කාලය අවසන් වීමෙන් එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්‍ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැ" යි ඔවුන් එම තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත් එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සැහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්‍ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම එම කාර්යය පිළිබඳ නිසි බලධාරීහුගේ කැමැත්ත පරිදි සිදු වේ.

(iii) මෑතදී ලබා ගත් චරිත සහතික දෙකක් (දැනටමත් රජයේ සේවයෙහි නියුක්ත නිලධාරීන්ගෙන් මෙම සහතික අනවශ්‍ය ය).

(iv) ධුරාපේක්ෂකයාගේ සිංහල/දෙමළ දැනීම පිළිබඳව සෑහෙන සහතිකයක් හෝ වෙනත් ලේඛනගත සාක්ෂි.

රජයේ සේවයෙහි නියුක්ත වූවන් චරිත සහතිකවල පිටපත් එවීමෙන් පමණක් නිදහස් කරනු ලබන බව සැලකිය යුතුයි.

6. දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවිය යුතු රජයේ සේවකයින් ගේ ඉල්ලුම් පත්‍ර නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබුණ හොත් ඒවා නියමිත දිනට කලින් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට ලැබී, ප්‍රමාදයට පිළිගත හැකි කරුණු දක්වා දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් පිළිගත මැනවැයි නිර්දේශ කරනු නො ලැබුවහොත් පිළිගනු නො ලැබේ. උපකෘත පාඨශාලා ගුරුවරුන් ගේ ඉල්ලුම් පත්‍ර තම තමන්ගේ කළමනාකාරවරුන් මගින් ඉදිරිපත් කළ යුතුයි. එසේ ඉදිරිපත් කරන විට ඔවුන් සේවයෙන් නිදහස් කළ හැකි ද යන වග සඳහන් කරන ලෙස ද කළමනාකාරවරයන්ගෙන් ඉල්ලා සිටිය යුතුයි. රජයේ පාඨශාලාවල උපගුරුවරුන් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර මූල්ගුරුවරයා මගින් එවිය යුතු අතර මූල්ගුරුවරුන්ගේ ඉල්ලුම් පත්‍ර, කෙලින්ම එවිය හැක. නියමිත ආකෘති පත්‍රය අනුව පිළියෙල නො කරන ලද ඉල්ලුම් පත්‍ර භාර ගනු නො ලැබේ. ආකෘති පත්‍රය පහත සඳහන් ආදර්ශයෙන් පිටපත් කරගත යුතුයි. මුද්‍රිත ආකෘති පත්‍ර නොමැත. ඉල්ලුම් පත්‍ර දෙපාර්තමේන්තුවේ කවර නිලධාරියෙකුට හෝ පෞද්ගලිකව නො එවිය යුතුයි.

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදයේ ආරම්භයෙහි පළ කොට ඇති රාජ්‍ය සේවා තනතුරුවලට පත් කිරීම්වලට අදාල පොදු කොන්දේසි ද බලනු මැනවි.

එස්. එෆ්. ද සිල්වා,
අධ්‍යාපන අධ්‍යක්ෂ.

අංකය : ඊ.බී.බී. 3379.
1960 මාර්තු මස 7 වැනි දින,
කොළඹ 2,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දීය.

## ආදර්ශ ආකෘති පත්‍රය

### පාඨශාලා පරීක්ෂක තනතුර පිළිබඳ ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :———.

2. ලිපිනය :———.

3. උපන් දිනය හා ස්ථානය :—

(1) ඉල්ලුම්කරු :———.

(2) ඉල්ලුම්කරුගේ පියා :———.

(3) ඉල්ලුම්කරුගේ පියාගේ පියා :———.

(4) ඉල්ලුම්කරුගේ පියාගේ පියාගේත් පියා :———.

ඉල්ලුම්කරුගේ උප්පැන්න සහතිකයේ පිටපතක් (මුල් පිටපත නොවේ) ඇමිණිය යුතුය. ගැසට් නිවේදනයේ 5 (1) ඡේදය බලන්න.)

4. ඉල්ලුම්කරු විවාහකද යන වග :———.

(i) එසේ නම්, භාර්යාවගේ/පුරුෂයාගේ නම හා රක්ෂාවේ විස්තර :———.

5. (i) ඉල්ලුම්කරුගේ ජාතිය :———.

(ii) ලාංකිකයකු නම්, ලියාපදිංචි කිරීමෙන් හෝ පරම්පරාවෙන් ද යන වග :———.

6. (i) දැනට නියුක්ත රක්ෂාව හා එහි විස්තර :———.

(ii) (අ) ශික්ෂකයකු නම් ලියාපදිංචි කළ අංකය :———.

(ආ) දැනට ලබන වාර්ෂික වැටුප :———.

(ඇ) වැටුප් ක්‍රමය හා මිළඟ පඩි වැඩිවීමේ දිනය :———.

7. ශාස්ත්‍රීය සුදුසුකම් (සහතික පත්‍රවල පිටපත් (මුල් පිටපත් නොවේ) ඇමිණිය යුතුයි. ගැසට් නිවේදනයේ 5 (ii) ඡේදය බලන්න) :—

(අ) උපාධියේ නම :———.

(ආ) විශ්ව විද්‍යාලය :———.

(ඉ) විභාග අංකය :———.

(ඊ) වර්ෂය :———.

(උ) විෂයයෝ :———.

(ඌ) බාහිර ද අභ්‍යන්තරද යන වග :———.

8. (i) වෘත්තීය හා වෙනත් සුදුසුකම් :———.

(ii) පුහුණු ගුරුවරයෙක් නම් පහත සඳහන් විස්තර සපයන්න :—

(අ) පුහුණුව ලද ආයතනය :———.

(ආ) පුහුණුව ලද කාලය :———.

(ඉ) සිංහලද/දෙමළද/ඉංග්‍රීසිද යන වග :———.
(සහතික පත්‍රවල පිටපත් (මුල් පිටපත් නොවේ.) ඇමිණිය යුතුයි. ගැසට් නිවේදනයේ 5 (ii) ඡේදය බලන්න.)

9. (අ) සිංහල දැනුම :———.

(ආ) දෙමළ දැනුම :———.

(ඇ) ඉංග්‍රීසි දැනුම :———.
(ගැසට් දැන්වීමේ 4 (අ) ඡේදය බලන්න.)

10. ඉගැන්වීමේ පලපුරුද්ද (පාඨශාලාවල නම්, දරු තනතුරු හා ඒ ඒ පාඨශාලාවල ඉගැන්වූ කාල පරිච්ඡේද දින සමග සඳහන් කරන්න.) :

| පාඨශාලාවේ නම | දරූ තනතුර | බැඳුණු දිනය | අස් වූ දිනය | සේවා කාලය | | | අස්වීමට හේතුව : ස්ථාන මාරු කර යැවීමෙන්ද, ඉල්ලා අස්වීමෙන් ද, සේවය නතර කිරීමෙන්ද, සේවයෙන් පහ කිරීමෙන්ද යන වග |
|---|---|---|---|---|---|---|---|
| | | | | අවු. | මා. | ද. | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | එකතුව | | | | | | |

11. යුද්ධ සේවා සටහන (අස්වී යෑමේ සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.) :———.

12. සහතික දෙනු ලබන අයගේ නම :———.
(සහතික තුනකට වැඩි නොවන ගණනක පිටපත් ඇමිණිය යුතුය.)

ම විසින් මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුනු විස්තර සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය හෝ වැරදි දෙයක් ලියා තිබෙන බැව් තෝරීමට කලින් අනාවරනය වුවහොත් මා එයින්ම නුසුදුසු බවට පැමිණෙනවා පමණක් නොව, තෝරීමෙන් පසු ඒ බව දැනගන්නට ලැබුණොත් කිසිම වන්දියක් රහිතව, මා රාජකාරියෙන් පහකර දැමීමට යටත් වන බවද මම දනිමි.

———,
අත්සන.

දිනය :———.

## පළාත් පාලන දෙපාර්තමේන්තුව

### යන්ත්‍ර පදවන්නෙකුගේ තනතුර

### කතරගම ජල සම්පාදන යෝජනා ක්‍රමය නඩත්තු කිරීම

පළාත් පාලන දෙපාර්තමේන්තුවේ කතරගම ජල සම්පාදන යෝජනා ක්‍රමය නඩත්තු කරගෙන යාම පිළිබඳව II වැනි ශ්‍රේණියේ පුහුණු යන්ත්‍ර පදවන්නෙකුගේ තනතුරක් සඳහා මෙයින් ඉල්ලුම්පත්‍ර කැඳවා සිටිනු ලැබේ.

2. මේ තනතුර සඳහා නියමිත වැටුප් ක්‍රමය පළමුවැනි මාස හය සඳහා දිනකට රුපියල් 2.10 බැගින් වන අතර එතැන් සිට අවුරුද්දකට රුපියල් 750—42—රු. 1,086 ක් ද වෙයි.

3. මේ තනතුර තාවකාලික වන අතර විශ්‍රාම වැටුප් රහිතද වන්නේ ය.

4. තනතුර ඉල්ලුම්කරුවන්—

(අ) වයස අවුරුදු 35කට වැඩි නොවිය යුතුවූද ;

ගත යුතුයි. එසේ භාරදෙන ටෙන්ඩර් පත්‍රය බහා ඇති කවරයේ ටෙන්ඩර් කරුගේ නම හා ලිපිනයද වැඩයේ නමද ලියා එවිය යුතුයි.

7. වර්ෂ 1960 අප්‍රියෙල් මස 8 වෙනි සිකුරාදා පෙරවරු 10.30 ට මහනුවර අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට විවෘත කරන ස්ථානයෙහි සිටීමට අවසර දෙනු ලැබේ. තවද, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් එක් එක් ටෙන්ඩරයේ ගාස්තු ප්‍රමාණයද ටෙන්ඩර් කරුගේ නමද පැමිණ සිටින අයට ඇසෙන සේ කියවනවා ඇත.

8. ටෙන්ඩර් කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබූ අවසාන දින සිට සති 6 කට නොඅඩු කාලයක් තුළ ස්වකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුයි.

9. වෙනත් අවශ්‍ය විස්තර මහනුවර අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත හැකි අතර ටෙන්ඩර් සම්බන්ධ ලියකියවිලිද මෙහිදී පරීක්ෂා කර බැලිය හැක.

10. වැඩය භාරගන්නා කොන්ත්‍රාත් කරු විසින් සේවයෙහි යොදවනු ලබන සියළුම සේවකයින් ලාංකිකයින් විය යුතුවා පමණක් නොව වැඩය කෙරෙන ප්‍රදේශයෙන්ම තෝරා ගැනීමට සෑම උත්සාහයක්ම දරිය යුතුය. ලාංකිකවූ හා වැඩය කෙරෙන ප්‍රදේශයෙහි වූ සේවකයින් පමණක් වැඩෙහි යෙදවීම කොන්ත්‍රාත් හිමිසුමේ කොන්දේසියක් වන අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ සම්මුතිය ඇතිව අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් අවසර දෙනු ලබන විශේෂ අවස්ථාවන් හිදී හැර අන් සෑම විටම ඉහතකී කොන්දේසිය නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකළ සේ සලකනු ලැබීමටද කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමටද යටත් වේ. එවැනි අනුමතියක් හෝ අවසරයක් නොමැතිව ලාංකික නොවූ හෝ වැඩය කෙරෙන ප්‍රදේශයෙහි නොවූ සේවකයින් වැඩෙහි යෙදවීම තහනම්ය.

ජී. එච්. බී. ඒකනායක,
ම. ප. අධ්‍යාපන නිලධාරි තැන.

1960 මාර්තු මස 12 දින,
අධ්‍යාපන කාර්යාලය, මහනුවර.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1960 පෙබරවාරි මස 26 වෙනි දින අංක 12,068 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ අ/යකල්ල සහ අ/මඩවල සිංහල මිශ්‍ර පාසල්හි ගුරු නිවාස සෑදීම සඳහා පළ වූ ටෙන්ඩර් දැන්වීම් සම්බන්ධවයි.

ඉහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අන්තිම දිනය 1960.3.25 දක්වා කල් දමා ඇති බව මෙයින් දන්වනු ලැබේ.

එච්ලින් ප්‍රනාන්දු,
අධ්‍යාපන නිලධාරිනි, අනුරාධපුර.

අධ්‍යාපන කාර්යාලය,
අනුරාධපුර, 12.3.60.

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### මහලියැද්ද නිවාස යෝජනා ක්‍රමය—බදුල්ල

බදුල්ලේ මහලියැද්දේ සාදා ඇති කුලියට සින්නවීමේ ක්‍රමයට දිය හැකි අඩු කුලී ගෙවල් 11 ක් සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ලංකාවේ පුරවැසියන් ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ:—

(අ) තමන්ගේ සහ තමන්ගේ භාර්යාව/පුරුෂයා ගේ සම්පූර්ණ මාසික ආදායම රුපියල් 200 ට නොවැඩි අය;

(ආ) නිවාස පිහිටි ස්ථානයේ සිට සැතපුම් 5 ක අර්ධ විෂ්කම්භයක් තුළ ස්ථිරව පදිංචි තමන්ගේ නමින් හෝ තමන්ගේ භාර්යාවගේ/පුරුෂයාගේ නමින් හෝ තමන් ගෙන් යැපෙන ළමයෙකුගේ නමින් හෝ ගෙයක් නොමැති අය.

2. සෑම ගෙයක්ම පිහිටා ඇත්තේ දළ වශයෙන් පර්චස් 15 ක් පමණවූ ඉඩමකය. ගෙවල් වල වහල උළු සෙවිලි කර ඇති අතර බිම සිමෙන්තියෙන් සාදා ඇත. එක ගෙයක ඉස්තෝප්පුවක්, කාමර දෙකක්, මුළුතැන් ගෙයක් සහ ජල මුද්‍රිත වැසිකිළියක් බැගින් තිබේ.

3. අවුරුදු 25 කින් මුළු මුදල ගෙවී යන පරිදි ගෙයක කුලිය මසකට රුපියල් 21ක් පමණ වේ.

4. ගෙයි පදිංචිකාරයාට ගෙයි නීත්‍යානුකූල අයිතිය පැවරෙන්නේ මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් කළ විටය. ගෙයි පදිංචිකාරයා යම්කිසි අවස්ථාවකදී ශෙෂව තිබෙන මුදල එකවිටම ගෙවා දැම්මත් සමඟම ගෙයි නීත්‍යානුකූල අයිතියක් ඔහුට පවරා දෙනු ලැබේ. ගෙයි පදිංචියට ගියදා සිට ගෙයි පදිංචිකාරයා විසින්ම ගෙය නඩත්තු කළ යුතුවා පමණක් නොව, ගෙවල් කුලියද වරිපණම් හා වෙනත් ගාස්තුද ගෙවිය යුතුවේ.

5. ගෙවල් වල පදිංචිය සඳහා සුදුසු අය තෝරා ගනු ලබන්නේ ජාතික නිවාස කොමසාරිස් වරයා විසිනි. මොනවා අයථා පෙළඹීමක් ඇති වුවහොත් එයම ඉල්ලුම් කරුවකු නුසුදුස්සකු වීමට කාරණයක් වන්නේ ය. තේරීම කරනු ලබන්නේ කුසපත් ඇදීමෙන් ය. කුසපත් ඇදීමේ දිනය සහ ස්ථානය පුවත් පත් නිවේදනයකින් පසුව දන්වනු ලැබේ. කුසපත් ඇදීම ඉල්ලුම් කරුවන්ට නැරඹිය හැක.

6. කොළඹ, ජාතික නිවාස දෙපාර්තමේන්තුව මේ සඳහා පිළියෙල කර ඇති ඉල්ලුම් පත්‍ර මගින් ඉල්ලුම් කළ යුතු අතර එකී ඉල්ලුම් පත්‍ර 1960 අප්‍රේල් 22 වන දිනට හෝ ඊට පෙර ජාතික නිවාස කොමසාරිස් තැන වෙත ලැබෙන සේ එවිය යුතුය. ඉල්ලුම් පත එවා දින 21 ක් තුළදී එය ලැබුණු බවට දන්වීමක් නොලැබුනොත් ඒ බැව් දන්වා තැපැල් කාර්යාලයේ ලියාපදිංචි කරන ලද ලිපියකින් මෙම දෙපාර්තමේන්තුවට දන්විය යුතුය. ඉල්ලුම් පත් බහා එවනු ලබන පිට කවරයේ වම් පැත්තේ ඉහළ කෙළවරේ "බදුල්ල ගෙවල් සඳහා ඉල්ලුම් පත්" යැයි සඳහන් කළ යුතුය.

ආර්. ඇල්. ආර්නෝල්ඩ,
ජාතික නිවාස කොමසාරිස් තැන.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැපැල් පෙට්ටිය නො. 544,
කොළඹ 2.

---

## 1959-60 වර්ෂයේ මහර බන්ධනාගාරයට ඉරටු සැපයීම

පහත අත්සන් කරන ලද අය විසින් මහර බන්ධනාගාරයට භාරගත් දින සිට 1960 සැප්තැම්බර් මස 30 වෙනිදා දක්වා කාලය තුළ ඉරටු සැපයීම සඳහා 1960 අප්‍රේල් මස 5 වෙනි අඟහරුවාදා පෙරවරු 9.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

(අ) මුද්‍රා තබන ලද සැම්පල් වෙන වෙනම මහර බන්ධනාගාරයේ අධිකාරි තැන වෙත ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් පත්‍ර පමණක් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි.

පහත අත්සන් කළ අයවෙත ඉල්ලුම් පතක් ඉදිරිපත් කිරීමෙන් ලබාගන්නා මුද්‍රිත පත්‍රවල ටෙන්ඩර් සඳහන් කළ යුතුයි. රුපියල් 10 මහර බන්ධනාගාර කාර්යාලයේ හෝ කච්චේරියක තැන්පත් කිරීමෙන් ලබා ගන්නා කුවිතාන්සියක් ඉදිරිපත් කළවිට ටෙන්ඩර් ඉල්ලුම් පතක් ලබාගත හැක.

නියම කරණලද මිළ ගණන් ටෙන්ඩර් පත්‍රයේ අකුරෙන් සහ අංක වලින් දැක්විය යුතුයි. මිළ ගණන් අංක වලින් සඳහන් කොට එයම අකුරෙන් වෙනස්ව සඳහන් කළ හෝ මිළ ගණන් අකුරින් සඳහන් නොකළ ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් එවීමට නොසතුටු ප්‍රාදේශීය ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ නියෝජිතයන් මගින් පිටත මුද්‍රා සහිත තම ලිපිනය සඳහන් කළ ටෙන්ඩර්පත්‍ර පුද්ගලිකවම මහර බන්ධනාගාරයේ අධිකාරි තැනවෙත ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් පත්‍ර පෙට්ටියේ බහාලීමෙන් පසු කුවිතාන්සියක් දෙනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ නියමිත වෙලාව ඉකුත් වූ වහාම පහත අත්සන් කළ අයගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී එහි පැමිණිය හැක.

ඊ. ඇල්. ප්‍රනාන්දු,
අධිකාරි තැන.

මහර බන්ධනාගාරය,
රාගම, 11. 3. 60.

---

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

වර්ෂ 1960 මැයි 1 වැනි දින සිට 1960 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා පහත සඳහන් ද්‍රව්‍යයන් වැලිකඩ බන්ධනාගාරයේ බේකරියට සැපයීම පිණිස 1960 අප්‍රේල් මස 11 වැනි දින පෙරවරු 9.30 දක්වා මෙහි පහත අත්සන් කරන ලද අය විසින් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ:—

| | | ටෙන්ඩර් පත්‍ර සඳහා තැන්පත් මුදල | ඇප මුදල | මසකට අවශ්‍ය සාමාන්‍ය ප්‍රමාණය |
|---|---|---|---|---|
| | | රු. ශ. | රු. ශ. | රාත්තල් |
| (1) | වියලි බේකරි මුහුන් … | 20 00 | 100 00 | 80 |
| (2) | පාන් සෑදීම සඳහා සීනි වෙනුවට යොදන යව පිටි මිශ්‍රණය … | 20 00 | 150 00 | 150 |

මුද්‍රණය කරන ලද ටෙන්ඩර් ෆෝර්ම 1960 අප්‍රේල් මස 8 වැනි දින පස්වරු 3 දක්වා, ඒ සම්බන්ධයෙන් නියමිත මුදල් කොළඹ අයෙකු නම් බන්ධනාගාර කොමසාරිස් තුමාගේ කාර්යාලයේ තැන්පත් කිරීමෙන් හෝ පිට ප්‍රදේශ වැසියෙකු නම් ඔහාම

කච්චේරියක එකී මුදල තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් හෝ පහත අත්සන් කරන ලද අයගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

ද්‍රව්‍ය සම්බන්ධයෙන් සැම්පල් පහත අත්සන් කරන අයගේ කාර්යාලයට භාර දිය යුතුයි.

ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් එවීමට නොසතුටු ප්‍රාදේශීය ටෙන්ඩර් කරුවන් ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් මගින් ඊටත මුද්‍රා කරන ලද, ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකවම බන්ධනාගාර කර්මාන්ත අංශයේ අධිකාරි තැන වෙත භාර දිය යුතුයි. ඔහු විසින් ටෙන්ඩර් පත්‍ර ඒ සඳහා ඇති පෙට්ටියේ බහාලීමෙන් පසු කුවිතාන්සියක් දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර මෙසේ භාර දීමේදී ටෙන්ඩර් පත්‍රය කුමක් සඳහා ද යන බව සහ ටෙන්ඩර්කරුගේ ලිපිනයත් දිය යුතුයි.

ටෙන්ඩර් පත්‍ර 1960 අප්‍රේල් මස 11 වැනි දින පෙරවරු 9.40 ට මෙහි පහත අත්සන් කරන අයගේ කාර්යාලයේදී විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට මේ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

වැඩි විස්තර සඳහා පහත අත්සන් කරන අයගෙන් විමසිය යුතුයි.

ජේ. ඒ. පෙරුමාල්,
බන්ධනාගාර කර්මාන්ත අධිකාරී.

1960 මාර්තු මස 7 වැනි දා,
කොළඹ 9,
බන්ධනාගාර මූලස්ථානයේදීය.

---

## සුරාබදු දෙපාර්තමේන්තුව

**1960 ජූනි මස 1 වැනි දින සිට 1961 ජනවාරි 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ සිදුවේ බන්ඩාරවත්තේ පිහිටි රජයේ අරක්කු ඉස්කාගාරයට රා සැපයීම**

වර්ෂ 1960 ජූනි මස 1 වැනි දින සිට 1961 ජනවාරි 31 වැනි දින දක්වා වූ කාල සීමාව තුළ සිදුවේ බන්ඩාරවත්තේ පිහිටි රජයේ අරක්කු ඉස්කාගාරයට රා සැපයීම පිණිස, ටැන්ඩර් කර්මාන්ත හා ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1960 අප්‍රේල් මස 6 වැනි දින දවල් 12 දක්වා භාරගනු ලැබේ.

සුරාබදු කොමසාරිස් තැනගෙන් ඉල්ලුම් කිරීමෙන් ලබාගත හැකි පෝර්මවල ටැන්ඩර් ඉදිරිපත් කළ යුතු අතර, මේ පිළිබඳ සියළුම විස්තරද ඔහුගෙන් ලබාගත හැක.

ටී. බී. වඩුගොඩපිටිය,
සුරාබදු කොමසාරිස් තැන.

කොළඹ 6,
1960. 3. 14.

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

1960 මාර්තු 4 දින අංක 12,073 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ නාවලපිටියේ ආරෝග්‍යශාලාව විශාල කිරීම—මාතෘ වාට්ටුවක්, ලිපිකරු, නිවාස ආදිය සෑදීම සඳහා ටෙන්ඩර් දැන්වීම සම්බන්ධවයි.

ඉහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පෝර්ම ලබා ගන්නා අන්තිම දිනය 1960 මාර්තු 25 වැනිදාටත්, ටෙන්ඩර් භාර ගන්නා දිනය 1960 අප්‍රියෙල් 6 වෙනිදාටත් කල් දමා ඇති බව මෙයින් දන්වනු ලැබේ.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට.

ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ, 1960. 3. 14.

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

1960 පෙබරවාරි 26 වෙනි දින අංක 12,068 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ කොළඹ-ගාලුපාර, මොරටුවේ සිට පානදුරේ දක්වා මැනීම සඳහා පළවූ ටෙන්ඩර් දැන්වීම සම්බන්ධවයි.

ඉහත සඳහන් වැඩේට ටෙන්ඩර් පෝර්ම ලබා ගන්නා අන්තිම දිනය හා ටෙන්ඩර් භාර ගන්නා අන්තිම දිනය 1960. 4. 1 සහ 1960. 4. 6 දින දක්වා පිළිවෙලින් කල්දමා ඇති බව මෙයින් දන්වනු ලැබේ.

ජේ. ඩබ්ලිව්. ද අල්විස්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට.

ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ, 1960. 3. 14.

---

ගම්පොළ දිස්ත්‍රික්ක වෛද්‍ය නිලධාරි තැනගේ නිවාසය අළුත්වැඩියා කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 අප්‍රියෙල් මස 6 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. පතන, දිඹුල ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 අප්‍රියෙල් මස 1 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 5,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල අවශ්‍ය නැත :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය ;
(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන, නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්";
(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාමසංවර්ධන සමිති ; සහ
(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමූපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 1960. 3. 14.

---

කොළඹ පිටකොටුවේ පරණ නගර ශාලාවේ විශේෂ අළුත්වැඩියා කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 අප්‍රියෙල් මස 6 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කොළඹ, ටොරිංටන් චතුරශ්‍රයේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ කොළඹ නැගෙනහිර කොටස භාර ගොඩනැගිලි පිළිබඳ විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 අප්‍රියෙල් මස 1 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 13,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල අවශ්‍ය නැත :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය ;
(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන, නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්";
(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාමසංවර්ධන සමිති ; සහ
(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමූපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 1960. 3. 14.

කොළඹ නොරිස් කැනැල් පාරේ පිරිමි වෛද්‍ය නේවාසිකාගාරයක් සෑදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්‍ෂ 1960 මැයි මස 4 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කොළඹ, ටොරිංටන් චතුරශ්‍රයේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නිර්මාණ ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්‍ෂ 1960 අප්‍රියෙල් මස 22 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැඟිලි වැඩ සඳහා රුපියල් 3,65,000ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 250 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය ;

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන, නිදසුනක් : "චෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝප රේෂන්";

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්‍ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාමසංවර්ධන සමිති ; සහ

(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමූපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායසීලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ටී. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්‍ෂක වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 1960. 3. 14.

# බඩු බාහිරාදිය විකිණීම්

## වෙන්දේසියේ විකිණීමයි

පහත සඳහන් ද්‍රව්‍ය 1960 මාර්තු මස 31 වෙනි දින පෙරවරු 9ට කොළඹ පාර්සන්ස් පාරේ රජයේ ගබඩා දෙපාර්තමේන්තුවේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ :—

හම්බර් කාර්, ජීප්, "පාකර් 51" පෑනක්, යතුරු ලියන, වානේ පීප්ප, රෙදි කෑලි ආදිය.

මේවා බලා ගැනීමට 30 වෙනි දින පෙරවරු 9 යේ සිට පස්වරු 3 දක්වා ඉඩ කඩ තිබේ.

ලබා ගන්නා සෑම ද්‍රව්‍යයකටම මුදල් ගෙවා වෙන්දේසිය නිමවන විගසම ඉවත් කළ යුතුයි.

ඩු. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1960 මාර්තු මස 14 වෙනි දින,
රජයේ ගබඩා දෙපාර්තමේන්තුව.

## දැන්වීමයි

අබලන් තත්ත්වයේ කෙඳි කැඩපත් ඔරුවක් (ප්‍රමාණය : 8' .9" × 4'. 0") ත්‍රිකුණාමලයේ පොලිස් ස්ථාන භූමියේ දී 1960 මාර්තු මස 26 වැනිදා පූ. භා. 10 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ගැනුම්කරු විසින් මුදල් ගෙවා ඔරුව එම ස්ථානයෙන් ගෙන යා යුතුය.

ඇම්. ආර්. ගුණරත්න,
සහකාර පොලිස් සුපිරින්ටැන්ඩන්ට්තුමා,
ත්‍රිකුණාමලය.

1960 මාර්තු තුන්වන දා,
ත්‍රිකුණාමලයේ පොලිස් කාර්යාලයේ දී ය.

## විශෙෂ නිවේදනයයි

1960 මාර්තු 29 වැනි අඟහරුවාද ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1960 අප්‍රේල් 1 වැනි දින නිකුත් කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1960 මාර්තු 26 වැනි සෙනසුරාද පස්වරු 12.30 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1960 මාර්තු 1 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.